# දැන්වීමයි

## රුහුණ විශ්වවිද්‍යාලය

### රුහුණ විශ්වවිද්‍යාලයීය උපකුලපති තනතුර සඳහා අයදුම්පත් / නාමයෝජනා කැඳවීම (2022 - 2025)

ඉහත කරුණට අදාළව 2021.08.01 දින ඉරිදා සිළුමිණ පුවත්පතෙහි පළ කරන ලද දැන්වීම සම්බන්ධයෙනි. එකී දැන්වීමට අනුව අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනය 2021.08.27 දින විය. එසේ වුවද 2020.08.20 දින දිවයින පුරා ක්‍රියාත්මක වූ අගුළු දැමීම පිළිබඳ තීරණය සහ එය 2021.09.13 දක්වා තවදුරටත් ක්‍රියාත්මකව පවතින බැවින් අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය දීර්ඝ කරනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

පවතින මෙම වාතාවරණය යටතේ අගුළු දැමීමේ සීමාවන් ඉවත් කිරීමේ දින සිට සතියක කාලයකින් මෙම අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය දීර්ඝ කිරීමට රුහුණ විශ්වවිද්‍යාලයීය පාලක සභාව විසින් තීරණය කර ඇත. එකී නව දිනය හා වේලාව රුහුණ විශ්වවිද්‍යාලය විසින් අගුළු දැමීම අවසන් කළ වහාම සිය නිළ වෙබ් අඩවිය (www.ruh.ac.lk) මගින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ අනුව ස්වකීය අයදුම්පත් / නාමයෝජනා අදාළ ලියකියවිලි සමඟ ලේඛකාධිකාරී කාර්යාලය, රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර යන ලිපිනය වෙත ලියාපදිංචි තැපැල මඟින් හෝ අතින් ගෙනැවිත් භාරදීමට හෝ විද්‍යුත් තැපැල මඟින් (regoffice@admin.ruh.ac.lk) නව අයදුම්පත් භාර ගැනීමේ දින ප.ව. 3.00 ට හෝ ඊට පෙර එවීමට කටයුතු කළ යුතුය.

පෙර දැන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සහ කොන්දේසි නොවෙනස්ව පවතින බව කරුණාවෙන් සලකන්න.

මේ පිළිබඳව කිසියම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වේ නම් රුහුණ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී (දු.අ. +94412222998) මඟින් ඇමතීමට හෝ regoffice@admin.ruh.ac.lk යන විද්‍යුත් තැපැල් ලිපිනය මඟින් විමසීමට හැකි බවද සලකන්න.

**ලේඛකාධිකාරී සහ පාලක සභාවේ ලේකම්,**
**රුහුණ විශ්වවිද්‍යාලය**
2021.09.09